17 වන පිටෙන්

ගිම්හාන සුළඟ

මම ඇඳෙන් නැගිට්ටෙමි. පිස්සන් කොටුවක් වැනි වූ කාමරයෙන් පිටව සාලයට ආවෙමි. තේ එකක් බොන්නට ඇත්නම් යයි සිතෙයි. කුණු බැඳුණ වතුර කේතලය සොයා ලිප තැබුවෙමි. සෝදන බේදමේ පිරී ඇති පිඟන් කෝප්ප වලින් නැගෙන පිළුණු ගඳ ඉවසිය නොහැකි තරම් ය. මම වතුර රත් වන තෙක් ඒවා සේදුවෙමි.
තේ කොළ හා සීනි ජේන තෙක් මානයක නොවී ය. මම පැන්ට්‍රියේ කබඩ් ඇර ඒවා සොයා ගන්නට වෙහෙසුණෙමි.
රෝස පැහැති බෙහෙත් පෙති පිරුණ කුඩා බෝතලයක් පළමුව මගේ අතට අසුවිය.

මා දන්නා තරමින් අශේන්ට බෙහෙත් බොන්නට අසනීපයක් නොවී ය. එනිසා මේ බෝතලය මසිත තුළ කුහුළක් ඇති කරන්නට සමත් විය. පියන විවෘත කර බලන්නට සිත බල කලේ එනිසා ය.

“ඕක මෙහාට දෙන්න...“ අශේන් පිටුපසින් පැමිණ මා අතින් බෝතලය ඩැහැ ගත්තේ ය. ඔහු එය කොයි තරම් වේගයකින් කළේ ද යත් මම පසෙකට විසි වී ගියෙමි.

සොරි කෞෂි.. රිදුනද..? ඔහු මගේ අතින් අල්ලා ගත්තේ ය. පෙරදා රැයේ සිටි අශේන්ට වඩා තැන්පත් පෙනුමක් දැනු ඔහු වෙතින් දිස් වනනේ යයි මම සිතුවෙමි. මම ඔහුගේ උරහිසට හිස තබා ගත්තෙමි. ඔහු බොහෝ දයාබරව මගේ හිස අත ගෑවේ ය. මම හැඬුවෙමි. ඇති තරම් හැඬුවෙමි. මට අම්මාත් තාත්තාත් සිහිවිය. එවිට වේදනාව තවත් වැඩි වෙයි. ඔහු මට බාධා නොකර මා තුරුළු කර ගත් වන ම බලා සිටියේ ය.

“අඬන්න එපා..“ බොහෝ වේලාවකට පසු ඔහු කීවේ ය. ඔහු මගේ හිස ඔසවා සිය පිටි අත්ලෙන් මගේ කඳුළු පිස දැමුවේ ය. .. “ හිනාවෙන්න... මං දැනං හිටපු කෞෂි නම් හැමතිස්සෙම හිනා වෙච්ච කෙනෙක්..“ ඔහු සිනාසෙන්නට වෑයම් කළේ ය. මා යටි සිතෙන් කවදත් ඇළුම් කළ ඔහුගේ ප්‍රසන්න සිනාව මසිතේ බර බොහෝ දුරට අඩු කළේ ය.
“දැන් මට කියන්න මොකද ඊයෙ රෑ වුණේ කියලා...“
“ඇති යන්තාං ඒක අහන්න ඔයාට සිහි කල්පනාවක් ආවා..“ මම කීවෙමි.. ඔහු පිළිතුරක් නොදී සිනාසුණේ ය.

“මට මේක හීනයක් වගේ.. මට කවදාවත් කැමැත්තක් නොපෙන්නුව කෞෂි... මම පණයන්න ආදරේ කළ කෞෂි මෙන්න මගේ ගෙදරටම ඇවිත්.. හීනයක් නෙවෙයිද..?“

හීනයක් කියලා හිතා ගන්න.. මම කිවෙමි.
“ඊයෙ මොකද වුණේ..?“
“අහන්න එපා..“ මම කිවෙමි. “.. ආයෙ ආයෙ ඒවා මතක් කරන්න මට බැහැ.. අපි ඉස්සරහට කරන්න තියෙන දේ ගැන බලාගනිමු...“
ඔහු කිසිවක් නොකියා මවෙතින් මෑත්වූයේ ය.
“ඇයි කල්පනා කරන්නෙ..?“ මම ඇසුවෙමි. “.. ඔයාට මාව කරදරයක් වෙයි නේද..? එහෙමනම් කියන්න..“
“පිස්සුද..? මං කොයි තරම් නම් කාලයක් හීන මැව්වද ඔයා මගේ කරගන්න.. “ ඔහු මිමිනුවේ ය.
“ඒත් ඔයාගෙ තාත්තා කොහෙත්තම කැමති වෙන එකක් නැහැ.. එහෙම නේද..?“ මම ඇසුවෙමි ඔහු පිලිතුරක් නොදුන්නේ ය. ඒ නිහඬතාව ම පිළිතුරක් ලෙස මම බාර ගතිමි.
“අපේ තාත්තා වුණත් කැමති වෙන එකක් නැහැ..“ මම කීවෙමි. ඔහු නිහඬවම මගේ මුහුණ දෙස බලා සිටියේ ය.

“අද ඔයා වැඩට යන්නෙ නැහැ නේද..?“ මම ඇසුවෙමි. ඔහු නොමැතිව හුදකලා වන්නට මම බිය වූයෙමි. මේ මොහොතේ ඔහු මා සමග සිටිය යුතුය.
“වැඩට..?“ ඔහු වහා ඇසුවේ ය.
“ඇයි..? ඔයා දැන් රස්සාවකට යනවා නේද..? මට මතකයි ඔයා කලින් දවසක මා එක්ක කිව්වා.. “
“ඕහ්... අද මං කොහොමද වැඩට යන්න කෞෂි.. අද අපි සෙලිබ්රේට් කරන්න ඕනෙ දවසක් නෙ.. අද අපි දෙන්නා කොහේ හරි ලස්සන තැනකට යමු.. දවසම කතා කරමු.. ඉන්පස්සෙ කොහේ හරි නිස්කලංකා රෙස්ටුරන්ට් එකකින් රෑට කමු.. අද දවස අපි ලස්සන දවසක් කරගනිමු..“

“නෑ.. නෑ.. එයිට කලින් කරන්න වැඩ ගොඩක් තියෙනවා.. දැන් ඔහොම බලා ඉඳලා හරි යන්නෙ නැහැ ළමයෝ .. අපි වැඩ පටන් ගමු... ඉස්සෙල්ලාම මේ කුණු ගොඩ අස් කරන්න ඕනෙ... අපි දැන්ම පටන් ගමු ද..?“ මම ඇසුවෙමි.

“පටන් ගමු.. ඔහු කීවේය. ... ජීවිතේ අලුතින්ම පටන් ගමු.. “.

“එයිට කලින් මම අම්මට කෝල් එකක් දීලා ඉන්නම් නේද..? අම්මා හොඳටම බය වෙලා ඇති මම කෝ කියලා.. “ මම ඇසුවෙමි.

“ගන්න“ අශේන් දුරකථනය මා අතට දුන් නේ ය. මා මේ සියල්ල අම්මාට කෙසේ කියන්නද..? මම ගැහෙන හදින් යුතුව අංක එබුවෙමි.
දුරකථනය තුළින් ආවේ නැන්දා ගේ හඬයි.
“දෙයියනේ දුව ඔයා කොහෙද ඉන්නෙ.. ?“ ඕ මගේ හඬ ඇසුණ හැටියේම ඇසුවා ය. මම පිළිතුරක් නොදුන්නෙමි.
“අනේ ඉක්මනට ගෙදර එන්න... මේ හැටි ගිණි ගෙඩි අපි කොහොම උහුලන්නද දුවේ.. ?“ නැන්දා හඬයි.
“ගෙදර...? මම ආයෙ ඔය ගෙදර පස් පාගන්නෙ නැහැ නැන්දා..“
“කෞෂි මේ මොනාද කියන්නෙ...? අපි මෙහේ ගිණි පත්තු වෙලා ඉන්නවා..“

“අම්මා කෝ..?“ මම ඇසුවෙමි.
“අම්මා.. අම්මා..“ නැන්දා යමක් කියන්නට උත්සාහ ගනියි.
“මට අම්මට කතා කරන්න ඕනෙ...“ මම නොයිවසිල්ල සඟවාගන්නට තැත් නොකරමින් නැවත කීවෙමි.
“දූ .. කෞෂි දැන්ම එන්න.. දැන්ම..“ නැන්දා කතා කරන්නේ තේරුම් ගත නොහැකි කලබලයකිනි.

“නැන්දා මට අම්මට කතා කරන්න ඕනෙ..“
“අනේ දුවේ.. අම්මා... අම්මව උදේ හොස්පිට්ල් එකට ඇතුල් කළා... “
මගේ දෙපා ගැහෙන්නාක් මෙන් මට දැනෙයි.
මම රිසිවරය දැඩිව අල්ලාගෙන සිටියෙමි.

ඇ... ඇයි..

එයා.. එයා.. උදේ නැගිට්ටෙ නැහැ.. එයා.. එයා... නැන්දා ගොත ගසයි.. එයා නිදි පෙති වැඩිපුර බීලා..

ලබන කලාපයට

ගී
සඳළුව
Gee... Sandaluwa
සිසිර දිසානායක

වයලීන මවන හීන

තමන්ගෙ මව් පදිංචි වෙලා ඉන්න මව් රටේදි කෙරෙන්න තිබුණු විදිහේ වටිනා අවස්ථාවක් මෙල්බන් නුවර රසිකයන් අතරේදී උදා කර ගත් අපූරු සංගීත ශිල්පියෙකු ගැනයි මේ ලියවෙන්නේ. ඒ අප ක්වරුත් දන්නා රෝහණ ධර්මකීර්ති. රෝහණ ගේ සංගීත ජීවිතයේ වැදගත් මං සළකුණක් -වයලීන මැවූ හීන- සංයුක්ත තැටිය. එය එළි දැක්වීමට රෝහණ තෝරා ග්තේ මෙල්බන් නුවර. කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියාලේ -සංහිඳ පාමුළ- ප්‍රසංග වේදිකාව. එය මෙපුර වාසී සියළු ගී රසික රසිකාවියනට කළ ගෞරවයක් ලෙසටයි අපට දැනෙන්නෙ.

ඊට හේතු බොහෝමයි. රෝහණගේ ගී තනු සංගීත රටාවන්ගෙන් තමන්ගේ ගීත නිර්මාණ ඔප කරවාගන්නට උනන්දුවන මේ නුවර වාසී සංගීත ශිල්පීන් ප්‍රමාණය සුලු පටු නෑ. එරට මෙරට යා කරන සංගීතයේ තානාපති වරයෙක් විදිහටත් රෝහණ කටයුතු කරනවා වෙලාවකට. ඒ අනෙකුත් ශිල්පීන්ගේ නිර්මාණයන්ද මෙරට ශිල්පි ශිල්පිනියන්ට යොමු කරවීමෙන්. මෙරට ශිල්පීන් එරට නිර්මාණකරුවන් වෙත යා කරවීමෙන්. මේ සෑම දෙයකම පසුබිමේ රෝහණගේ එක්කුස උපන් නැගනිය ද සෙවනැල්ලක් වගේ ඉන්න බව දැනෙනවා.
-සුළඟක් වී මං යනවා- ගීතය ඇහෙනකොට මුලින්ම මතක් වෙන්නෙ ළමා ගායිකා නතාෂා පෙරේරා ව. ඒ පසු පසින් විශාරද එඩ්වඩ් ජයකොඩිගේ තමන්ගේ හඬ අවදි කරනවා. මේ සුරතල් ගීතය ඇතුලත සිසාරා යන සංගීත සංකලනයත් තනුවත් නිමැවුණේ රෝහණ ධර්මකීර්ති අතින්. ඒ මෙහෙමයි.
-ගුවන් විදුලියට සම්බන්ධ සමන්තට හිතවත් කෙනෙක් ආවා තමන්ගේ දුවට ගීත හතරක් කරවාගන්න. එයාගේ ඉල්ලීමට ඒ ගී හතරම කළේ මම.. ඒ සින්දු අතරේ තිබුණ එක සින්දුවක් තමයි සුළඟක් වී .. ආනන්ද ඒ ළමයා අතේම මට ඔය සින්දුව එවලා තිබුණා..- ආනන්ද කියලා කිව්වෙ ගීතය රචනා කළ ආනන්ද හේවා රංහිඳගේ.. විශාරද දීපිකා ප්‍රියදර්ශණී ගායනා කළ -අහස නුඹ මෙතරම්- ජානක වික්‍රමසිංහ ගායනා කළ -දෙවොරේ දිළෙනා- වැනි ගීත රචනා කළ රචකයායි ආනන්ද.
-මුළින්ම මම ළමයාගේ කට හඬ පරීක්ෂා කලා.. ඒ හඬ හිතේ තියාගෙන ගෙදර එන ගමන් මේ ගැන හිතුවා.. මම වැඩ ඇරිලා ගෙදර යන්න වේයන්ගොඩට එනකල් එන්නෙ කෝච්චියෙන්.-
රෝහණගේ ගම වේයන්ගොඩට නුදුරු මුද්දරගම හිරිකුළුවේ. -ඉතින් කෝච්චියේ එන ගමන් මම එක එක විදිහට මේ සින්දුව කියව කියවා ආවා.. හිටපු ගමන් දෙවෙනි අන්තරා කොටසට තමයි තාලයක් ආවේ.. ඒ කොටස හරිම සංවේදී විදිහට ආනන්ද අතින් ලියවිලා තිබුණා. තාත්තා කෙනෙකුට වඩාත් ළංවෙන්නෙ දුවක් කියලයි මට හිතෙන්නෙ.. එහෙම දුවකගෙ හුරතල් බොළඳ වචන ඒ විදිහටම ලියවිලා තිබුණ නිසා මගේ ඇස් වලට කඳුලු ආවා. ඒත් එක්කම ඒ වචන වලින් කියවෙන යටි අදහසත් අගේට දැනුණා.. ඒ කොටසට මුලින්ම තනුවක් වැටුණෙ ඒ නිසා වෙන්න ඇති කියලා මට හිතෙනවා..-

රෝහණ හොඳ රසිකයෙක්.. වෙනත් අයගේ නිර්මාණ ගැන වුණත් කතා කරන්නේ බොහෝම හැඟුම්බරව. සාහිත්‍යය පිළිබඳ රෝහණගේ දැනුම ඉතාම ඉහළ තලයකයි තියෙන්නෙ. නිර්මාණයක තියෙන වටිනාකම සංවේදීව රස විඳීන්න හැමෝටම බැහැ. විශේෂයෙන්ම අනුන්ගේ නිර්මාණ වල වටිනාකම, අන්න්ගේ දේ අගය කරන අව්‍යාජ කලාකරුවන් ඉන්නෙ කීයෙන් කී දෙනා ද?
-තාත්තාගේ කොටස ගායනා කරන්න එඩ්වඩ් ව යෝජනා කළේ මම. ළමා ගීතයකට ගැලපෙන ගායන ශෛලියත් ගැමි කටහඬත් තනුවට සාධාරණයක් ඉෂ්ඨ කරයි කියලා මට හිතුණා. මුලින්ම නතාෂා මේ සින්දු හතර මාධ්‍ය වලට දුන්නා. මාධ්‍ය වලින් ලැබුනේ පුදුම ප්‍රතිචාරයක්.. පස්සේ ගීය එයාගේ සුළඟක් වී සංයුක්ත තැටියට එකතු කළා. ගීතය ජනප්‍රිය වුණ නිසාම එඩ්වඩ් ගේ දේදුණු පාලම තැටියටත් මේ සින්දුව ගත්තා. මේ සින්දුව නිසා මම අත්විඳපු අත්දැකීම් කියන්න බැරි තරම්..- රෝහණ කතාව හමාර කලා.



විශාරද රෝහණ ධර්මකීර්ති කළකට පෙර නැසී ගිය කවියකු වන මුද්දරගම හිරිකුළුවේ සුසිල් ප්‍රේමසිරි සහ එම මැතිණියගේ දරුවන් තිදෙනාගෙන් දෙවැන්නායි. ගස්පේ කළිෂ්ඨ විද්‍යාලය, කොළඹ ආනන්ද විද්‍යාලය, බාඳුරාගොඩ ධර්මාශෝක, හුණුමුල්ල් විද්‍යාලය වැනි විද්‍යාලයන්හි ආදි ශිෂ්‍යයකු වන ඔහු කැළණිය සරසවියේ භෞතික විද්‍යා අංශයේ උපාධිධාරියෙක්. වයස අවුරුදු නවයේදී දහයේදී වයලීනය තුරුළු කරවූ දෙමාපියන් රෝහණ ගේ සංගීත දිවියට අකුල් හෙළුවේ නැහැ. කුඩා කල පටන්ම ගුවන් විදුලියේ සංගීත වැඩසටහන් වලට සම්බන්ධ වුණ ඔහු අද එහි සංගීත අංශයේ සංගීත වැඩ සටහන් අධ්‍යක්ෂවරයෙකි. ඒත් රසිකයන් ඔහු වඩාත් හඳුනා ගන්නේ මාරිම්බා සංගීත කණ්ඩායමේ ප්‍රවීණ වයලීන හා ගිටාර් වාද්‍ය ශිල්පියෙකු විදිහටයි.

රෝහණ තනු නිර්මාණය කළ කරුණාරත්න දිවුල්ගනේ ශිල්පියා ගායනා කළ අන්දර යායේ, පියල් අමරසිංහ ගායනා කළ නටුවෙන් ගිළිහුණ පින්න මලක්, වැනි ගීත වගේම නෙලූ අධිකාරි, නීලා වික්‍රමසිංහ වැනි ශිල්පිනියන් ගායනා කළ ගීත අද ඉතාම ජනප්‍රියයි.

ගීයක පිටුපස සැඟවුණ කතාව

සුළඟක් වී මං යනවා
දුර අහසේ ඇවිදින්නට
අප්පච්චී කොහොමද
මං අල්ලන්නේ

අහසක් සේ දූ යන මග
පුළුන් වළා අතුරනවා
එහෙමයි මගෙ දෝණී
මං රැක ගන්නේ

මහ ගංවතුරක් වීලා
හරි වේගෙන් මං ගලනවා
ලොකු ගස් වැල් කඳු වැටි හෙම
උදුරා පොළවට දමනවා
අප්පච්චී කොහොමද මං වළකන්නේ

මං මහ මුහුදක් වෙනවා
දූ එනතුරු තනි රකිනවා
ආදරයෙන් මඟ බලනවා
තුරුළට ගෙන සනසවනවා
මං ළඟ නොවැ දූ
සැමදා සැනහෙන්නේ

මං බොරු තරහක් ගන්නවා
ඇස් රතු වෙනකල් අඬනවා
තුරුළට අරගෙන හිටියත්
නැළවෙන් නැතිවම ඉන්නවා
අප්පච්චී කොහොමද
මං නළවන්නේ

දූටත් වැඩියෙන් හයියෙන්
එතකොට නම් මට ඇඬෙනවා
දූගෙ කඳුළු මං ගන්නවා
දූ නැළවෙනකල් අඬනවා
මං ඇඬුවම දූ
නොවැ මා නළවන්නේ

ගායනය නතාෂා පෙරේරා/ එඩ්වඩ් ජයකොඩි
පද ආනන්ද හේවා රංහිඳ
තනුව සංගීතය රෝහණ ධර්මකීර්ති

ග්‍රැෆික් නිර්මාණය
රොෂානි ඕපනායක